www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මිලිටරිය ගුවන් ප්‍රහාරයක දී එල්ටීටීඊ දේශපාලන නායකයා ඝාතනය කරයි

## Sri Lankan military assassinates LTTE political leader in air strike

**සරත් කුමාර විසිනි**
**2007 නොවැම්බර් 5**

සිකුරාදා උදෑසන දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ උතුරු බල මධ්‍යස්ථානය වන කිලිනොච්චිය අසල ප්‍රදේශයකට ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එල්ල කරන ලද ප්‍රහාරයකින් එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු වූ එස්.පී. තමිල්චෙල්වම් ඝාතනය කෙරුනි. “ඉතා විශ්වාස කටයුතු තොරතුරක්” මත පදනම් වූ පහර දීමක් ලෙස ගුවන් හමුදා ප්‍රකාශකයකු විස්තර කල මෙම ප්‍රහාරයෙන් තවත් ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නිලධාරින් පස් දෙනෙක් මරනයට පත් විය.

තමිල්චෙල්වම් හිතාමතාම ඉලක්ක කර ගැනීම, තමන් 2002 සටන් විරාම ගිවිසුමට බැඳී සිටින බවට ශ්‍රී ලංකා ආන්ඩුව කරන කියාපෑම්වල ද රටේ දිගු කාලීන සිවිල් යුද්ධය සාකච්ඡාමය අවසානයකට ගෙන ඒමක් පිලිබඳව එය විටින් විට කරන කැඳවුම්වල ද පවත්නා ව්‍යාජ ස්වභාවය එලිදරව් කරයි. එල්ටීටීඊ දේශපාලන අංශයේ නායකයා ලෙස, තමිල්චෙල්වම්, පසුගිය පස් වසරක කාලය තුල ශ්‍රී ලංකා ආන්ඩුව සමග පැවති සාම සාකච්ඡාවල එල්ටීටීඊ නියෝජිත කන්ඩායම් බොහොමයකට සහභාගි වී තිබුනි නැත හොත් ඒවායේ නායකත්වය ගෙන තිබුනි.

2006 ජුලි මස සිට මේ දක්වා, ජනාධිපති මහින්ද රාජපක්ෂ, 2002 සටන් විරාම ගිවිසුම විවෘතව ම උල්ලංඝනය කරමින්, දිවයිනේ නැගෙනහිර එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීමේ ආක්‍රමනික මෙහෙයුම් මාලාවක් දියත් කර තිබේ. මෙම මෙහෙයුම් “ආරක්ෂක” ස්වභාවයක් ගත් බවට කල මවාපෑමේ එල්ලය වූයේ මහ බලවතුන්ගේ සහයෝගය රැකගැනීම යි. එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු ඉලක්ක කොට මරා දැමීම මගින් පැහැදිලි කෙරෙන්නේ, ආන්ඩුවට බැරෑරුම් සාකච්ඡා පැවැත්වීමේ කිසිදු අභිප්‍රායක් නැති අතර එහි අභිප්‍රාය වන්නේ එල්ටීටීඊය මිලිටරිමය ලෙස විනාශ කිරීම බව යි.

ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමය අධීක්ෂනය කරන එක්සත් ජනපදය, යුරෝපා සංගමය, නෝර්වේ සහ ජපානය යන බලවතුන්ගෙන් එක් අයෙකු වත් මෙම විවෘත යුද ක්‍රියාව විවේචනය කරමින් එක වදනක් වත් පිටකර නැත යන්න අර්ථභාරී ය. පසුගිය බ්‍රහස්පතින්දා කොලඹ එක්සත් ජනපද තානාපති රොබට් බ්ලේක් මෑත එල්ටීටීඊ ප්‍රහාරයක් හෙලා දකිමින් එහි දී ඝාතනයට ලක් වූ මිලිටරි භටයන්ගේ පවුල්වලට සිය ශෝකය ප්‍රකාශ කලේ ය. ශ්‍රී ලංකාව පිලිබඳ සාකච්ඡාවලට සම්බන්ධ වූ රාජ්‍යතාන්ත්‍රිකයන්ගෙන් බොහොමයක් පුද්ගලිකව හඳුනන තමිල්චෙල්වම්ගේ මරනය සම්බන්ධයෙන් එවන් ප්‍රකාශයක් නිකුත් කෙරී නැත. ආන්ඩුවේ ක්‍රියාව සම්බන්ධයෙන් මහ බලවතුන් දක්වන නිශ්ශබ්දතාව සමාන වන්නේ ආන්ඩුවේ යලි ඇරඹූ යුද්ධය සම්බන්ධයෙන් ඔවුන් දක්වන අනුමැතියට යි.

කොලඹ පාලක කව තමිල්චෙල්වම්ගේ මරනය පිලිගත්තේ යන්තමින් පාලනය කර ගැනුනු කාලකන්නි සන්තෝෂයකිනි. එල්ටීටීඊ දේශපාලන අංශයේ නායකයා මෑත මිලිටරි මෙහෙයුම් බොහොමයකට සම්බන්ධව සිටි බව කියාපාමින් තමිල්චෙල්වම්ගේ ඝාතනය යුක්තියුක්ත කිරීමට මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර උත්සාහ දැරී ය. 40 හැවිරිදි වියෙහි සිටි තමිල්චෙල්වම්ට, 1993 දී ශ්‍රී ලංකා මිලිටරිය සමග පැවති සටනක දී බරපතල ලෙස තුවාල ලැබීමෙන් පසුව අසීරුවෙන් ඇවිදීමට සිදු වූ බව ප්‍රකට කරුනකි.

තමිල්චෙල්වම්ගේ මරනය සන්නද්ධ හමුදාවන්ගේ “ධෛර්යය වර්ධනයී කිරීමක් වන අතර එය “එල්ටීටීඊයට බරපතල පාඩුවක්” වනු ඇතැයි නානායක්කාර උදම් ඇනී ය. ගුවන් ප්‍රහාරය සිදු වූයේ, එල්ටීටීඊ ගරිල්ලන් උතුරේ අනුරාධපුර නගරය අසල පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන කඳවුරකට විනිවිඳ ගුවන් යානා ගනනාවක් විනාශ කිරීමෙන් හෝ ඒවාට හානි සිදු කිරීමෙන් සති දෙකක් ගත වීමටත් පෙර ය. එල්ටීටීඊයේ එම ප්‍රහාරය මගින් සිදු වූ ද්‍රව්‍යමය පාඩුවට වඩා හානිකර වූයේ මිලිටරිය එල්ටීටීඊය පලවා හරිමින් සිටින බවට ආන්ඩුව ගෙන යන ප්‍රචාරක ව්‍යාපාරය එමගින් සිදුරු කරනු ලැබීම යි.

සිකුරාදා හැන්දෑවේ කල කතාවක දී. රාජපක්ෂ ඔවුන් “සිය මව්බිම කැබලි වීමේ බරපතල අන්තරායෙන් ගලවා ගැනීමට උපරිම කැපවීමකින්” ක්‍රියා කරන බව කියමින් සන්නද්ධ හමුදාවන්ට ප්‍රශංසා කලේ ය. තමිල්චෙල්වම් ඝාතනයට ඍජු සැඳහුමක් නොකරමින් ම, ආන්ඩුව

“ගෞරවනීය සාමයකට” කැප වී ඇති බවත් එල්ටීටීඊයට “කොන්දේසි පැනවියේ” නොහැකි බවත් ජනාධිපති යලිත් අවධාරනය කලේ ය. මේවා වනාහි එල්ටීටීඊයට කිසිදු සහනයක් නොදෙන බවත් එහෙයින් කිසිදු සාකච්ඡාවක් නොපැවැත්වෙන බවත් අදහස් කරන උදාන පාඨයන් ය.

ජනාධිපතිගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සිය අභිප්‍රායන් සඟවා ගැනීමට කිසිදු උත්සාහයක් දැරුවේ නැත. “මෙය ඔවුන්ගේ නායකයන් ඉන්නා තැන් අප දන්නා බවට කල සංඥාවක් පමනයි. සියලු ම නායකයන් සිටින තැන් මම දන්නවා. . . . අපට ඕන නම් ඔවුන් එකිනෙකා බිලි ගන්න පුලුවන්,” යැයි ඔහු රොයිටර් පුවත් සේවයට පුරසාරම් දෙඩී ය. නොපමාව “එලියට එන” ලෙස ඔහු එල්ටීටීඊ නායකයන්ගෙන් ඉල්ලා සිටියේ ය. වෙනත් වචනවලින් කියතොත් එහි අර්ථය නම් කොන්දේසි විරහිතව යටත් වන ලෙස යි.

යුද්ධය උත්සන්න කල යුතු යැයි ඉල්ලා සිටින සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද මහත් උද්දාමයට පත්ව සිටියේ ය. ඝාතනය මිලිටරිය හා මහජනතාව ලද ජයග්‍රහනයක් ලෙස විවෘතව ප්‍රකාශ කරන ලෙස ජවිපෙ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශ ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. ජවිපෙ මන්ත්‍රී විජිත හේරත් ගුවන් ප්‍රහාරය විස්තර කලේ, අනුරාධපුර ප්‍රහාරයෙන් පසුව සාම සාකච්ඡා යලි අරඹන ලෙස ඉල්ලා සිටි අයට එල්ල වූ පහරක් ලෙස ය.

කොලඹ පුවත් පත් ද ඝාතනය උත්සවාකාරයෙන් පිලිගත්තේ ය. දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රය සෙනසුරාදා සිය ලිපියේ ශීර්ෂ පාඨය ලෙස යෙදුවේ “ගුවන් හමුදාව අනුරාධපුර ප්‍රහාරයේ පලිය ගනී, අලුයම කොටින්ගේ ප්‍රසිද්ධ මුහුන බිලි ගනී” යන්න යි. ඉරිදා ලක්බිම නිව්ස් පත්‍රය තමිල්චෙල්වම්ට ගෞරව දක්වන එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන්ගේ ඡායාරූපයක් පල කලේ “මේ පාර ඔහු---ඊලඟ පාර . . ?” යන පාඨය යටතේ ය. වෙනත් වචනවලින් කියතොත්, එය වනාහි ප්‍රභාකරන් මරා දමන ලෙස ඉල්ලා සිටීමකි.

2002 සටන් විරාම ගිවිසුමට අත්සන් කල හා තමිල්චෙල්වම් ද ඇතුලු එල්ටීටීඊය සමග සාකච්ඡාවලට සම්බන්ධ වූ විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප), තවමත් ප්‍රකාශයක් නිකුත් කර නැත. එහෙත් එජාපය ආන්ඩුවේ යලි ඇරඹූ යුද්ධයට ද වාර්ගික ආතතීන් අවුලුවාලීමට ද අනුගත වෙමින් සිටින බව දැනටමත් පැහැදිලි ය. ඩේලි මිරර් පත්‍රයට කල අදහස් දැක්වීමක දී, එජාප ජාතික සංවිධායක එස්.බී. දිසානායක මෙසේ ප්‍රකාශ කලේ ය: “ඔහුගේ (තමිල්චෙල්වම්ගේ) මරනය සම්බන්ධයෙන් දුක් විය යුතු නැත.”

එල්ටීටීඊය තමිල්චෙල්වම් ඝාතනයට ප්‍රතිචාර දක්වා ඇත්තේ, වාර්ගික දේශපාලනයේ ඔවුන්ගේ ම රූපාකාරයකිනි. සෙනසුරාදා නිකුත් කල ප්‍රකාශයක එල්ටීටීඊ නායක ප්‍රභාකරන් මෙසේ ප්‍රකාශ කලේ ය: “සිංහල ජාතිය බිලි ගෙන ඇත්තේ, දෙමල කතා කරන ලෝකයේ ගැඹුරුතර ආදරයට පාත්‍ර වූ ද ජාත්‍යන්තර ප්‍රජාවගේ අති මහත් ගෞරවයට ලක් වූ ද දේශපාලන නායකයකුගේ ජීවිතය යි.” කුමන ආකාරයකින් ගත්තත්, සාමාන්‍ය සිංහල ජනයා යලි ඇරඹූ යුද්ධයට වගකිව යුතු නැතුවා මෙන් ම තමිල්චෙල්වම්ගේ මරනයට ද වගකිව යුතු නැත. වැඩ කරන ජනතාවගේ බහුතරය මෙම යුද්ධයට විරුද්ධ ය.

කම්කරුවන් භේද කොට ස්වකීය සමාජ පදනම්වලට මුක්කු ගසා ගැනීමට දෙමල විරෝධී ස්වෝත්තමවාදය ගසා කා ඇති ආනුෂංගික කොලඹ ආන්ඩු, 1983 සිට මේ දක්වා පවතින යුද්ධය සම්බන්ධයෙන් ඍජුව ම වගකිව යුතු ය. කෙසේ වෙතත්, වෙන ම දෙමල රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ එල්ටීටීඊයේ ඉදිරිදර්ශනය නියෝජනය කරන්නේ දෙමල කම්කරුවන්ගේ අවශ්‍යතා නොව දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා ය. 2002 දී ආන්ඩුව සමග සාකච්ඡාවලට ඇතුලු වීමෙන් එල්ටීටීඊය බලාපොරොත්තු වූයේ, කම්කරු පන්තිය පාලක ප්‍රභූවේ සියලු ම කොටස්වල අන්‍යොන්‍ය සූරාකෑමට ලක් කෙරෙන ලාභ ශ්‍රම වේදිකාවක් බවට දිවයින පරිවර්තනය කිරීමේ හැකියාව සලසන බලය බෙදා ගැනීමේ සැකැස්මක් ඇති කර ගැනීම යි.

සාම සාකච්ඡාවල අසාර්ථකත්වය හා රට යලි යුද්ධයට ඇද දැමීම මගින් ඔප්පු කෙරෙන්නේ ස්වෝත්තමවාදී දේශපාලනයෙන් බිඳීමට කොලඹ දේශපාලන සංස්ථාපිතයට ඇති ඓන්ද්‍රීය නොහැකියාව යි. තමිල්චෙල්වම් ඉලක්ක කොට මරා දැමීම වාර්ගික ආතතීන් අවුලුවාලීම එල්ල කොට ගත් අතර යුද්ධය තව දුරටත් උත්සන්න වීමට එය නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙනු ඇත. රාජපක්ෂ එවන් විධික්‍රම කරා හැරී ගැනීම, යුද්ධය මගින් පැටවෙන ආර්ථික බරට එරෙහිව වැඩෙන මහජන විරුද්ධත්වයේ හා අසන්තෘප්තියේ ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ ආන්ඩුවට මුහුන දීමට සිදුව ඇති ගැඹුරු අර්බුදයේ ප්‍රකාශනයකි.

පසුගිය සතියේ රාජ්‍ය අංශයේ ගුරුවරුන් 200,000ක් පමන සහභාගි වීමට නියමිතව තිබූ දෙදින වර්ජනය අවසාන මොහොතේ වලක්වනු ලැබුවේ වෘත්තීය සමිති නායකයන් ආන්ඩුවේ පීඩනයට යටත් වී එය නතර කිරීමට තීන්දු කල බැවිනි. පසුගිය සඳුදා සහ අඟහරුවාදා දහස් ගනන් රෝහල් සේවකයෝ වැටුප් වැඩිවීමක් ඉල්ලමින් හා පිරිහෙන සේවා කොන්දේසි සම්බන්ධයෙන් විරෝධය පාමින් වැඩ වර්ජනයක නිරත වූහ. පසුගිය බ්‍රහස්පතින්දා, දහස් සංඛ්‍යාත රැකියා විරහිත උපාධිධාරීන්ගේ විරෝධතා පෙලපාලියක් පොලීසිය විසින් ප්‍රචන්ඩ ලෙස බිඳ දමන ලදි.

ආන්ඩුව යුද්ධය සඳහා දැවැන්ත ලෙස වියදම් කිරීම, භාන්ඩවල මිල ගනන් ඉහල යාමට ආංශිකව බලපා

ඇති අතර එම ඉහල බඩු මිල වැඩ කරන ජනතාව මත නොඉවසිය හැකි බර පටවයි. ඔක්තෝබර් මාසයේ දී ජීවන වියදම් දර්ශකය 5,723 දක්වා තවත් ඒකක 210කින් නැංගේ ය. වාර්ෂික අනුපාතිකය ලෙස ගත් කල, මෙය සැප්තැම්බර් මාසයේ වූ සියයට 17.3ට සංසන්දනාත්මකව සියයට 19.3ක නැග්මකි. ආන්ඩුව මේ වසරේ ආරක්ෂක වියදම් සියයට 45කින් ඉහල දමා ඊලඟ වසරේ දී එය තවත් සියයට 20කින් නැංවීමට සැලසුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආන්ඩුවේ සහනාධාර හා සේවාවන් මෙන් ම, රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ වැටුප් හා සේවා කොන්දේසි ද කප්පාදු කෙරී ඇත.

වැඩෙන අසන්තෘප්තිය මඩිනු පිනිස, ආන්ඩුවේ ඇමතිවරු වතාවතක් ලෙස විරෝධතා හා වර්ජන දේශද්‍රෝහී ක්‍රියා ලෙස හංවඩු ගසන අතර ප්‍රජාතන්ත්‍ර විරෝධී හදිසි නීති රෙගුලාසි මාලාවක් පනවා ඇත. වඩාත්ම මෑතක දී, ඔක්තෝබර් 29 දා, රාජපක්ෂ, ආරක්ෂක උපකරන මිලදී ගැනීම ඇතුලු, මිලිටරි හමුදා මෙහෙයුම් හෝ ක්‍රියාකාරකම් පිලිබඳ සියලු ප්‍රවෘත්ති වාරනය කරන නව හදිසි නීති රෙගුලාසි ප්‍රකාශයට පත් කලේ ය. මෙම පියවරේ එල්ලය වූයේ යුද්ධය පිලිබඳ විවේචන මැඩීම පමනක් නොව යුක්රේනයෙන් මිග්-27 ප්‍රහාරක යානා මිලදී ගැනීම පිලිබඳව මතුව ඇති සෝලි ද යට ගැසීම යි. විරෝධතා රැල්ලකින් අනතුරුව එම රෙගුලාසි ඉවත් කර ගැනීමට ආන්ඩුවට සිදු විය.

එල්ටීටීඊය එකට එක කරනු ඇතැයි කියාපාමින්, මාර්ග බාධක පැනවීම, හැඳුනුම්පත් පරීක්ෂා කිරීම හා වැටලීම් වහාම උත්සන්න කිරීමක් යුක්තියුක්ත කිරීමට මිලිටරිය තමිල්වෙල්වම් සාතනය යොදා ගත්තේ ය. සෙනසුරාදා, ආරක්ෂක හමුදාවෝ කොලඹ නගර මධ්‍යය දෙසට වැටුනු සියලු මහා මාර්ග අවහිර කොට සියලු වාහන හා මගීන් පරීක්ෂාව ලක් කලහ. අගනුවර ආරක්ෂාව තර කරනු පිනිස අමතර භට හමුදා යොදවා ඇතැයි කොලඹ නගරය භාර නියෝජ්‍ය පොලිස්පති නිවේදනය කලේ ය.

තමිල්වෙල්වම් ඝාතනය මගින් යලිත් වතාවක් අවධාරනය කෙරෙන්නේ, වැඩ කරන ජනතාව ඉදිරියේ පවත්නා දැවැන්ත අන්තරායන් සහ වාර්ගික දේශපාලනයේ සියලු රූපාකාරයන්ගෙන් -- සිංහල ස්වෝත්තමවාදයෙන් හා දෙමල බෙදුම්වාදයෙන් යන දෙකෙන් ම එක සේ -- මුලුමනින් ම බිඳී යුද්ධයට, සමාජ අසමානතාවට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරවලට විරුද්ධව සටන් කරනු පිනිස සමාජවාදී විකල්පයක් දෙසට හැරී ගැනීමේ අවශ්‍යතාව යි.

© www.wsws.org